මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/02 - 2021

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022.06. 30

**අයවැය චක්‍රලේඛ අංක: 04/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022 තෙවන කාර්තුව**

2021 අංක 30 දරන විසර්ජන පනත මඟින් වෙන් කර ඇති සීමාවන්ට යටත්ව 2022 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා වියදම් දැරීමට හැකි වන පරිදි ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් බලය ලබා දෙමින් අදාළ අධිකාරී බලපත්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල ව, මුදල් විෂයය භාර අමාත්‍ය තුමා විසින් අත්සන් තබා ඇත.

02. ඒ අනුව, 2022 ජූලි මස 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා වන තෙවන කාර්තුව තුළ ගෙවීම් වවුචර්පත් හා අදාළ වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2022 අංක 3 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

(ආ) විශේෂ නීති සේවා සඳහා - 2022 අංක 3 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය

(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2022 අංක 3 දරන අත්තිකාරම් බලපත්‍රය

03. ශ්‍රී ලංකා ආර්ථිකය දැනට මුහුණ දී ඇති ගැටළුකාරී තත්ත්වයන් තුළ විනිමය අනුපාතය අවප්‍රමාණය හා උද්ධමනය ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යන අතර ආදායම් සීමාසහිත බැවින් රාජ්‍ය මූල්‍ය අවකාශය විශාල වශයෙන් පටු වී තිබේ. එබැවින්, දැඩි පාලනයකින් යුතු ව රාජ්‍ය වියදම් දැරීමට කටයුතු කළ යුතු අතර රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි සඳහන් උපදෙස් දැඩි ව පිළිපැදිය යුතු බව අවධාරණය කරමි.

04. ජාතික අයවැය චක්‍රලේඛ 02/2022 හි ඇතුළත් 03 හා 04 හි සඳහන් විධිවිධාන හා ජාතික අයවැය චක්‍රලේඛ 03/2021 හි ඇතුළත් 04 සිට 09 දක්වා වූ විධිවිධාන තව දුරටත් නො වෙනස් ව එසේ ම බලපානු ඇත.

05. අනුමත කාර්තුමය සීමාවන් ඉක්මවන ලෙස ගෙවීම් සඳහා බැඳීම් ඇතිකර නොගැනීම කෙරෙහි දැඩිව අවධානය යොමුකළ යුතු වේ. අක්මුදල් නොලැබීම මත පළමු හා දෙවන කාර්තුවේ ගෙවීමට නොහැකිවූ අතැති බිල්පත් නිරවුල් කිරීම කෙරෙහිද අවදානය යොමුකර වියදම් සැලසුම් කරගැනීමට කටයුතු කළ යුතු වේ.

06. මෙම වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්වී තිබුනද බැඳීම් ඇතිකර ගැනීමට ප්‍රථම අක්මුදල් ලබාගැනීමේ හැකියාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් විමසා තහවුරු කරගැනීමෙන් තොරව කිසිදු මූල්‍යමය බැඳීමක් ඇතිකර නොගත යුතුය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව